මගේ යොමුව / எனது இல. / My Ref. ADM/19/05/1 (2015) (Vol-2) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2021.04. 27

අමාත්‍යාංශ චක්‍රලේඛ : 02/2021

අධ්‍යක්ෂ ජනරාල්,
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
අධ්‍යක්ෂ/අතිරේක අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
විදුහල්පති/උපවිදුහල්පතිවරුන්,
කථිකාචාර්ය/උපදේශකවරුන්,

**<u>ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1986 අගෝස්තු 15 වන දිනැති අංක 415 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1986 ජනවාරි 01 දිනැති ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට ආදේශ කරනු ලැබූ, 2020 ජූලි 06 දිනැති අංක 2183/20 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2020 ජූලි මස 06 වන දින සිට ක්‍රියාත්මක වේ.

02. කාර්යක්ෂමතා කඩඉම්:

**I.** ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරීන් අංක 2183/20 දරණ හා 2020.07.06 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සේවා ව්‍යවස්ථාවේ සඳහන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සිය පරිවාස කාලය හෝ පත්වීම් දින සිට වසර 03ක් තුළ ද දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය දෙවන ශ්‍රේණියට උසස් කරනු ලැබූ දිනයේ සිට වසර 03ක් තුළ ද තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පළමුවන ශ්‍රේණියට උසස් කරනු ලැබූ දිනයේ සිට වසර 05ක් ගතවීමට පෙර ද සම්පූර්ණ කළ යුතුය.

**II.** 2020.07.06 දිනට පෙර බඳවාගෙන ඇති මේ දක්වා පළමු වන කාර්යක්ෂමතා කඩඉම සමත් වී නොමැති නිලධාරීන් ද නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

**III.** පූර්ව සේවා ව්‍යවස්ථාවේ විධි විධාන අනුව 2020.07.06 දින දක්වා පවත්වන ලද පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර ඇති නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නිලධාරීන් ලෙස සලකනු ලැබේ.



නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය
திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற் கல்வி பிரிவு
Skills Development & Vocational Education Division
354/2, "නිපුණතා පියස" ඇල්විටිගල මාවත, කොළඹ 05
354/2, "நிபுணதா பியச" எல்விட்டிகல மாவத்தை, கொழும்பு 05
354/2, "Nipunatha Piyasa", Elvitigala Mawatha Colombo 05
කාර්යාලය / அலுவலகம் / Office (+9411)2136500 (+9411)2597804 info@skillsmin.gov.lk www.skillsmin.gov.lk
පර්යේෂණ හා නව නිපැයුම් අංශය
ஆராய்ச்சி மற்றும் புத்தாக்க பிரிவு
Research & Innovation Division

ආ) එසේම පූර්ව සේවා ව්‍යවස්ථාව අනුව පැවති කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණයෙන් සමත් නොවූ එහෙත් එහි එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක් සමත්ව ඇති නිලධාරීන්, නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් පෑ ව දැක්වෙන විෂයයන් සමත් නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

| | අංක 415 දරණ 1986.08.15 දිනැති පූර්ව සේවා ව්‍යවස්ථාව | | අංක 2183/20 දරණ 2020.07.06 දිනැති නව සේවා ව්‍යවස්ථාව |
|---|---|---|---|
| **(i).** | සාමාන්‍ය පරිපාලනය - ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථාව හා රජයේ රෙගුලාසි, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | විෂයයන් දෙකම සමත්ව ඇති නිලධාරීන් | ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසි |
| **(ii).** | ගිණුම් | | |
| **(iii).** | අධ්‍යාපනය, අධ්‍යාපන නිතිය, පරිපාලනය හා අධීක්ෂණය | | කාර්මික අධ්‍යාපනය හා අධ්‍යාපන ක්‍රමවේදය |

ආ) එසේම මෙම නිලධාරීන් සඳහා ද පැරණි සේවා ව්‍යවස්ථාව අනුව ලද සහන වාර ගණන ද ඇතුලත්ව වාර 06ක සහන කාලයක් පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා ලබා දෙනු ලැබේ.

(ඇ) 2017.07.06 දිනට පසුව බඳවාගෙන ඇති නිලධාරීන් සහ 2020.07.06 දිනට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර නොමැති නිලධාරීන් පළමු කාර්යක්ෂමතා කඩඉම යටතේ ඇතුලත් ඉංග්‍රීසි විෂය සමත් විය යුතු අතර, එම නිලධාරීන්ට අදාළ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා 2023.07.06 දින දක්වා සහන කාලයක් ලබාදෙනු ලැබේ.

(ඈ) පූර්ව සේවා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ නොකළ නිලධාරීන්ගේ නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය දක්වා වැටුප් වර්ධකය විලම්භනය වීම වලංගුව පවතින අතර 2020.07.06 දින සිට නව කොන්දේසි අදාළ වේ.

IV. II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ නිලධාරීන්

(අ) නව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථාව යටතේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් වසර 03ක් ඇතුලත දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. ඒ සඳහා 2020.07.06 දින සිට 2023.07.05 දක්වා අදාළ නිලධාරීන්ට සහන කාලයක් ලබාදෙනු ලබන අතර එදින දක්වා නිලධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය කරනු නොලැබේ.

V. I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ නිලධාරීන්

(අ) නව සේවා ව්‍යවස්ථාව පළ කරන ලද 2020.07.06 දිනට ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I ශ්‍රේණියේ වසර 5ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ. තව ද 2020.07.06 දිනට I ශ්‍රේණියේ වසර 5කට අඩු සේවා කාලයක් සහිත නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා 2020.07.06 දින සිට වසර 5ක සහන කාලයක් ලැබේ.

(ආ) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර 05ක කාලයක් පශ්චාත් උපාධි අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා අවස්ථාව නිලධාරීන්ට ලබාදෙනු ලබන අතර, එසේ සම්පූර්ණ කරගනු ලබන නිලධාරීන් අදාළ අනෙකුත් සුදුසුකම් ද සම්පූර්ණ කර ඇත්නම් ඔවුන් එම අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කළ දිනය හෝ මෙම සේවා ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කරන දිනයට පසුව එළඹෙන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(ඇ) වසර 5ක් තුළ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය සහ වසර 5ක පශ්චාත් උපාධිය සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් අදාළ අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබූ දිනයේ සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව වේ.

**පී.ඩබ්. රාජපක්ෂ**
ලේකම්
නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය